**රාජ්‍ය මුද්‍රණ සංස්ථාව - 2017**
**------------------------------------**

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3. විගණකගේ වගකීම**
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1. තත්ත්වාගණනය කළ මතය**

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

-----------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS)**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 හි 31 සහ 33 වන ඡේද ප්‍රකාරව සංස්ථාවේ මූල්‍ය උපකරණ ( **Financial Instruments)** වලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට පැන නඟින අවදානම්වල ස්වභාවය හා තරම ඇගයීම පිණිස අවශ්‍ය වන පහත සඳහන් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

- සංස්ථාවේ මූල්‍ය අවදානම් කළමනාකරණයේ අරමුණු හා ප්‍රතිපත්ති
- මූල්‍ය අවදානම හා අවදානම් ඇතිවිය හැකි ආකාර

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---------------------------------------

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

---------------------------------------

**(i)** ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය, පවත්වාගෙන යාමේ අරමුණ ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන රු. 102,491 ක් වූ ප්‍රාග්ධන සංචිතය, රු.1,000,000 ක් වූ පොදු සංචිතය හා රු. 13,901,142 ක් වූ සංවර්ධන සංචිතය හා රු. 701,192,812 ක ප්‍රත්‍යාගණන සංචිතය පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ii)** ප්‍රමිතයෙහි 125 ඡේදය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් කඩදාසි මිලදී ගැනීම වෙනුවෙන් විවෘත කර තිබූ රු. 6,648,040 ක ණයවර ලිපි වටිනාකම මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

--------------------------------------

**(i)** මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම තුළ ඇතුළත් වෙළඳ ණයහිමි හා අනෙකුත් ණයහිමි ශේෂවල අඩුවීම රු. 358,925 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධනය වෙනස් වීම තුළ ඇතුළත් වෙළඳ ණය ගැති සහ අනෙකුත් ණය ගැති ශේෂ වල අඩුවීම ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු. 142,927,462 ක් වුවද එය රු. 142,827,462 ක් ලෙස දක්වා තිබුණි.

**(ii)** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුළත් නොවූ පෙර වර්ෂයේ ගැලපීම් ලෙස රු.3,010,982 ක අවිනිශ්චිත ශේෂයක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ලද මුදලක් සේ පෙන්වමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළනය කර ඇතත් ඒ තුළ හඳුනා නොගත් ගැලපීම් රු. 111,345 ක් ඇතුළත් කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

සමාලෝචිත වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වාර්තාවන්ට අනුව ලිතෝ අංශයේ යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු. 146,820,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයන් හි දී ලිතෝ අංශයේ යන්ත්‍ර හා උපකරණ තක්සේරු වටිනාකම රු. 40,000,000 ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.106,820,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. ඒ තුළින් ප්‍රත්‍යාගණන සංචිතය රු. 106,820,000 ක් අඩුවෙන් සහ වාර්ෂික ක්ෂය රු. 8,011,500 ක් අඩුවෙන් සටහන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අලාභය රු. 8,011,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.4 නොසැසඳුනු පාලන ගිණුම්**

-------------------------------

ණයහිමි පාලන ගිණුමේ සහ ණයහිමි ලෙජරයේ ශේෂ සැසඳීම සඳහා සැසඳුම් ප්‍රකාශයක් සකස් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයහිමි ශේෂය ණයහිමි ලෙජරයේ ශේෂයන්ට වඩා රු. 1,456,119 ක් වැඩි බව නිරීක්ෂණය විය. තවද ණයහිමි ලෙජරයේ රු. 1,941,784 ක් වූ ණයහිමියකු රු. 194,178 ක් ලෙස ණයහිමි ලේඛනයට ඇතුළත් කර තිබුණි.

**2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුවට රු. 10,535,542 ක් අයවීමට ඇති බව දන්වා තිබුණද සංස්ථාව විසින් එම දෙපාර්තමේන්තුව සඳහා රු. 2,754,825 ක මුදලක් පමණක් ගෙවීමට ඇති බවට ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුව විසින් ගෙවීමට කිසිදු ණය ශේෂයක් නොමැති බවට දන්වා තිබුණද එම දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු. 11,836,011 ක මුදලක් ගෙවීමට ඇති බවට සංස්ථාවේ ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ණයහිමි ශේෂය රු. 53,905,998 ක් වූ අතර ඉන් වටිනාකම රු. 10,056,845 ක් ණයහිමි කාල විශ්ලේෂණයට අනුව 2013 වර්ෂය සහ ඊට පෙර සිට පවතින බේරුම් නොකරන ලද ණය ශේෂවිය. එය මුළු ණයහිමියන්ගෙන් සියයට 19 කි.

(ආ) වර්ෂ 04 ට වැඩි එකතුව රු. 147,033,354 ක් වූ වෙළඳ ණයගැති ශේෂයක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය වූ රු. 527,327,575 කින් සියයට 28 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් සංස්ථාව වෙත රු. 9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු. 7,460,675 ක් වී තිබුණි. මෙම ශේෂ තුළ අවුරුදු 04 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු. 7,989,976 ක් සහ රු. 5,578,142 ක් වූ නමුත් මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. කඩදාසි සමාගමේ ව්‍යාපාර කටයුතු නතරවීම නිසා මෙම ශේෂ නිරවුල් කිරීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය කෙරේ.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වගන්තිය | ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක **PED 1/2015** දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය 4.2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංස්ථාවේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 15 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය සැපයීමට කටයුතු නොකර එක් අයෙකුට මාසිකව රු. 17,500 බැගින් සමාලෝචිත වර්ෂයේ රු. 3,132,500 ක දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2017 දෙසැම්බර් 11 දිනැති අංක **PED 03/2017** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 01, 02 සහ 03 වගන්ති | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 50,190,854 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස සංස්ථාවේ සභාපතිගේ නිර්දේශය මත පමණක් පදනම්ව ගෙවා තිබුණි. |
| (ඈ) | 2017 පෙබරවාරි 03 දිනැති අංක 2004/66 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී තොරතුරු ඉල්ලීමේ ලියාපදිංචි ලේඛනය, අභියාචනා ලේඛනය හා ප්‍රතික්ෂේප කළ විස්තර අඩංගු ලේඛනය නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය ආයතන විසින් පුරවැසි ප්‍රඥප්තියක් හඳුන්වා දී ඒ සඳහා ආයතනික යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම සිදු කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 229,273,949 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 74,649,560 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 154,624,389 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දල අතිරික්තය රු. 130,520,719 කින් අඩුවීම හා මූල්‍ය වියදම් රු. 37,624,144 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරික්තයක් වාර්තා කර තිබුණද 2016 හා 2017 වර්ෂයන්හි ඌනතාවයක් සිදුවී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ඌනතාවය සියයට 207 කින් වැඩිවී රු. 229,273,949 ක් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.550,885,453 ක් වූ සංස්ථාවේ දායකය වර්ධනය වී 2017 වර්ෂය අවසානයේදී රු. 579,601,971 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සංස්ථාවේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය 2013 වර්ෂයේ සිටම පිරිහෙමින් පැවතුණි. 2013 වර්ෂයේදී පිළිවෙලින් සියයට 35 ක් සහ සියයට 3 ක් වූ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 16 ක් සහ සියයට ඍණ 18 ක් දක්වා පිරිහී තිබුණි.

එසේම සංස්ථාවේ ද්‍රවශීලතාවය නිරූපණය කරන ජංගම සහ ක්ෂණික අනුපාතයද පිරිහී තිබුණි. 2013 වර්ෂයේදී පිළිවෙලින් 1.4:1 ක් සහ 1.05:1 ක් වූ ජංගම සහ ක්ෂණික අනුපාත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් 0.88:1 ක් සහ 0.63:1 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අරමුණු ඉටු කිරීමේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සහ ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 677,043,029 ක් සහ රු. 216,501,470 ක් වශයෙන් එකතුව රු. 893,544,499 ක ආදායමක් ලැබී තිබුණි. එය වර්ෂයේ සමස්ත ආදායම වූ රු. 1,249,839,033 කින් සියයට 71 ක් වූ බැවින් සංස්ථාව විසින් සිය ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය නොකර ආදායම් මූලාශ්‍ර දෙකක් පමණක් මත පදනම් වන බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන පොත්පත්, අධ්‍යාපනික ප්‍රකාශන, පුවත්පත්, සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීම, බෙදාහැරීම, අපනයනය කිරීම හා ආනයනය කිරීම සංස්ථාවේ අරමුණුගත කාර්යයන් වූ අතර එමගින් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා උපයාගත් ආදායම්, සංස්ථාවේ සමස්ත ආදායමින් සියයට 0.01 සිට 0.18 දක්වා පරාසයක වූ බැවින් එම අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අලෙවි සැලැස්මට අනුව සංස්ථා ප්‍රකාශන අලෙවි කිරීමට පාසල් 24 ක හා රාජ්‍ය ආයතන 10ක ප්‍රදර්ශන 34 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද ආයතන දෙකක ප්‍රදර්ශන දෙකක් පමණක් පවත්වා, පිරිවැය අධික වීම යන හේතුව මත ප්‍රදර්ශන පැවැත්වීම අතහැර තිබුණි. කෙසේ වුවද පිරිවැය අධික වීම මත එම තීරණය ගෙන තිබූ නමුත් නිසි පිරිවැය ගණනය කිරීමක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

2018 වර්ෂය වෙනුවෙන් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය සඳහා පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම පිණිස පුද්ගලික ආයතනයක් මගින් ආනයනය කරන ලද එකතු වටිනාකම රු. 179,801,775 ක් වූ කඩදාසි මෙට්‍රික් ටොන් 1,520 ක් වරායෙන් ප්‍රමාදවී නිදහස් කරගෙන තිබුණි. ඒ මත රු. 5,037,480 ක් වූ ප්‍රමාද ගාස්තුවක් ආනයනකරු වන උක්ත පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු වුවද එම ප්‍රමාද ගාස්තුවෙන් රු. 1,457,013 ක් සංස්ථාව විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවා තිබුණි.

(ආ) පාසල් පෙළ පොත් මුද්‍රණය සඳහා භාවිතා කරන ලද ආනයනික කඩදාසිවල දීප්තිය අඩුවීම නිසා ඒවා භාවිතා කර මුද්‍රණය කරන ලද පාසල් පෙළ පොත් වර්ග 18 ක් වෙනුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට ගෙවිය යුතු මුදලින් රු.1,084,990 ක් දඩ වශයෙන් අඩු කරගෙන තිබුණි.

(ඇ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව එම පෙළ පොත් කවරය සඳහා 220 **GSM** වර්ගයේ **"Double Side Coated Art Board"** භාවිතා කළ යුතු වුවද, ඒ වෙනුවට 230 **GSM** වර්ගයේ **"Double Side Coated Art Board"** භාවිතා කිරීම නිසා සංස්ථාවට රු. 1,056,362 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. නිෂ්පාදනය සඳහා අදාළ 220 **GSM** වර්ගයේ කඩදාසි තොග ප්‍රශස්ත මට්ටමින් පවත්වා නොගැනීම මෙයට හේතු විය.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------------

සංස්ථාවේ අලෙවිසැල් 12 න් අලෙවිසැල් 11 ක් සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත විකුණුම් වලින් සියයට 22 සිට සියයට 68 දක්වා පරාසයක සිය අලෙවි ඉලක්ක සපුරාගෙන නොතිබුණි.

**4.4 ඌන උපයෝජිත වත්කම්**

------------------------------

සංස්ථාවේ ඇති ලිතෝ මුද්‍රණ අංශය, උත්තල මුද්‍රණ අංශය හා පොත් බැදීමේ අංශයන්හි අයවැයගත යන්ත්‍ර පැයවලින් පිළිවෙලින් සියයට 33, සියයට 34 හා සියයට 85 ක් වශයෙන් එකතු යන්ත්‍ර පැය 100,974 ක් මුද්‍රණ වැඩ නොමැතිවීම නිසා වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි. ඒ හේතුවෙන් එම අංශයන්හි සේවයේ නියුතු 238 ක් වූ කාර්යමණ්ඩලයද එම කාලය තුළ සිය කාර්යයන් සඳහා අනුයුක්ත වී නොතිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සංස්ථාවේ සම්පත්**

----------------------------------------------------------------

සංස්ථාව සතු පාදුක්ක පානළුවෙහි පිහිටි ඉඩමෙන් තක්සේරු වටිනාකම රු. 107,000,000 ක් වූ අක්කර 13 රූඩ් 02 පර්චස් 06 ක ප්‍රමාණයක කර්මාන්ත පුරයක් ඇති කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබුණි. එහෙත් මෙම ඉඩම නීත්‍යානුකූලව එම මණ්ඩලයට පවරා දීමට හෝ ආපසු ලබා ගැනීම පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹීමට සංස්ථාව ක්‍රියාකර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 2012 වර්ෂයේදී සකස් කර තිබූ අතර වර්තමානයේදී සංස්ථාව මිලදී ගත් යන්ත්‍රෝපකරණ හා සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩලය **(Cadre Assessment)** සංශෝධනය කරවා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ පුහුණු වැඩ සටහන් 36 න් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර පුහුණු සැලැස්මට බාහිරව වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද මෙම වැඩසටහන් අතරින් මුද්‍රණ කාර්යයන්හි නියුතු කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් 04 ක් පවත්වා තිබුණද මුද්‍රණ කටයුතු වල නියුතු 476 දෙනෙකුගේ කාර්ය මණ්ඩලයෙන් ඒ සඳහා සහභාගී කර තිබුණේ 17 දෙනෙකු පමණි.

## 4.7 වෙළඳපොළ කොටස

තරඟකාරී වෙළඳපොළක ක්‍රියාත්මක වන රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් සිදුකරන අභ්‍යාස පොත් නිෂ්පාදනය, ප්‍රකාශන ග්‍රන්ථ පලකිරීම සහ වෙනත් වාණිජ මුද්‍රණ සම්බන්ධයෙන් තමන්ගේ වෙළඳපොළ කොටස අවබෝධකර ගැනීම සඳහා වෙළඳපොළ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂයන්හිදී සිදුකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්කකරා ලඟාවිය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ලඟාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය

ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 203,509,234 ක් වැය කර ඉතාලියේ නිෂ්පාදිත **Variable Data** මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීමට අදාලව ඉදිරිපත් වූ ලංසුවල තාක්ෂණික පිරිවිතර සැසඳීමක් සිදු නොකර මිල ගණන් මත පමණක් පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබීම නිසා ශක්‍යතා හා ඇගයීම් වාර්තාව අනුව මිලදී ගැනීමට අපේක්ෂිත මුද්‍රණ වේගය මිනිත්තුවට මීටර් 230 ක්වූ ෂඩ්වර්ණ මුද්‍රණ යන්ත්‍රය වෙනුවට මුද්‍රණ වේගය මිනිත්තුවට මීටර් 80 ක හා **VDP** කැමරා ඒකකයේ උපරිම වේගය මිනිත්තුවට මීටර් 50 ක්වූ ෂඩ් වර්ණ මුද්‍රණ යන්ත්‍රය මිලදීගෙන තිබුණි.

ෂඩ් වර්ණ මුද්‍රණ ඒකකයේ මුද්‍රණ වේගය විනාඩියකට මීටර් 110 ක් බවත් **VDP** කැමරා හා එතීමේ **(Folding)** ඒකකයේ වේගය විනාඩියට මීටර් 65 ක් බවත් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් විගණනයට දන්වා තිබුණි.

## 6.2 අයවැය පාලනය

වියදම් අයිතම 20 කට අදාලව අයවැයගත හා සත්‍ය වියදම සැසඳීමේදී සියයට 20 සිට සියයට 3,333 දක්වා පරාසයන් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.